**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2022**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සාගර විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සාගර විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 53 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලයක් වශයෙන් වත්කම් පන්තියක ධාරණ අගය අඩුවීමක් සිදුවන විටක එම අඩුවීම අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත යුතු වුවද රු.62,133,045 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රත්‍යාගණන ලාභයෙන් අඩුකර දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනයට ලැබී තිබූ රු.63,825,567 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කකරණ ප්‍රමිත 11 ප්‍රකාරව ගිණුම් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය තුල සේවය අවසන් කල නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ගෙවීමේදී පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට ගැලපීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් රු.563,582 කින් පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම හා වර්ෂයේ ඌනතාවය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පාරිතෝෂික ගෙවීමේදී වෙන් කරන ලද පාරිතෝෂික ගිණුමෙන් ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව කොන්ත්‍රාත් රැඳවුම් මුදල් වටිනාකම රු.7,569,134 ක් වුවත් අනුරූපී වාර්තා අනුව එම වටිනාකම රු.14,598,570 ක් වූයෙන් රු.7,029,436 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කරන ලද ලේඛනය ඉදිරිපත් කරන බව. | උපලේඛන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

## 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂවලදී උපචිත වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු.6,155,458 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් ඉවත් කර තිබුණද එකී උපචිත වියදම නිරවුල් කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2020.12.31 ට උපචිත වියදම් විස්තරය ඉදිරිපත් කිරීමේ දී අත්වැරදීමකින් ඉදිරිපත් කර තිබූ බවත් මේ වන විට සම්පූර්ණයෙන් නිවැරදිකර ඇති බව. | අදාල තොරතුරු සහ ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.22,149,528 ක් වූ වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ තුල වසර 05 ඉක්මවා තිබුණු අයිතම 06 කට අදාලව එකතුව රු.11,907,417 ක් වූ ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීත් අපොහොසත් වී තිබුණි. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ඇතුළත් අවසන් වාර්තාව මීළග විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කර මෙම ශේෂයන් සම්බන්ධව ක්‍රියා කරන බව. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 28,118,983 ක් වූ ගෙවිය යුතු ශේෂය තුල වසර 03 ට වැඩි එකතුව රු.6,147,363 ක් හා වසර 1 ත් 3 ත් අතර එකතුව රු.21,971,620 ක් වූ ශේෂ පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලද පසු නිරවුල් කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 151 (1) | තංගල්ල පීඨයේ වටිනාකම් ගණනය කරගත නොහැකි භාණ්ඩ වර්ග 200 ක් බඩු ලේඛන පොතෙහි ඇතුළත් නොකර කන්ටේනර් පෙට්ටි 02 ක් තුළ සහ කඩ කාමර 01 ක් තුළ අවිධිමත් ලෙස ගොඩගසා තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 502 (2) වගන්තිය | විශ්වවිද්‍යාලය විසින් රු.3,540,626ක් පෞද්ගලික විගණන ආයතනයකට ගෙවා වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීම සහ 2021 වර්ෂයේ දෙසැම්බර් 31 | පිළිතුරු ලබාදී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දිනට වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | |
| iii. | මුදල් රෙගුලාසි 570 | වසර 02 ඉක්මවා ගොස් තිබූ ඉකුත් තැන්පතු රු.7,119,436 ක කොන්ත්‍රාත් රඳවා ගැනීමේ මුදල් රජයේ ආදායමට බැර නොකර ආයතනයේ ආදායමට බැර කර තිබුණි. | ඉදිකිරීම් කටයුතු භාරව කටයුතු කරන ඉංජිනේරු වැඩහල් මගින් ලබාගෙන නැවත ගෙවිය යුතු තැන්පතු සම්බන්ධව තහවුරු කර ගැනීමෙන් පසු රු.7,119,436 ක් ආදායමට ගෙන ඇති බව. | වසර 02 ඉක්ම වූ රඳවා ගැනීමේ මුදල් රජයේ ආදායමට බැර කල යුතුය. |
| iv. | මුදල් රෙගුලාසි 756 | 2020 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| i. | XIX පරිච්ඡේදයේ 5.3.1 ඡේදය | තංගල්ල මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂක විසින් 2012 වර්ෂයේ සිට රජයේ උපලේඛනගත නිවාසයක පදිංචි වී සිටීම වෙනුවෙන් ඔහුගෙන් අයවිය යුතු එකතුව රු.688,113 ක්වූ නිවාස කුලී අයකරගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය |
| ii. | XIX පරිච්ඡේදයේ 5.2.2 ඡේදය | විශ්වවිද්‍යාලයට අයත් තංගල්ල විද්‍යාලයේ ගොඩනැගිලිවල කාමර බාහිර කථිකාචාර්යවරුන්ට නේවාසික පහසුකම් ලබා දීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව දිනකට රු.250 ක් බැගින් වූ කුලියක් අයකරගෙන තිබුණි. එසේම ජල හා විදුලි ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත | | | |
| i. | 23 (අ) වගන්තිය | යම් අයදුම්කරුවන් ප්‍රභේදයක් ඇතුළත් කර ගැනීම සඳහා වන යම් යෝග්‍යතා පරීක්ෂණයක් විභාග දෙපාර්තමේන්තුව විසින්, විශ්වවිද්‍යාලය විමසා පවත්වනු ලැබිය යුතු බව සඳහන්ව ඇතත්, මේ දක්වා පැවති යෝග්‍යතා පරීක්ෂණ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සිසුන් බඳවාගැනීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතු බැවින් විශ්වවිද්‍යාලයේ විභාග අංශය මඟින් යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන බව. | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලීය පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| ii. | 66 වන වගන්තිය | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා අදාල කර නොගත යුතු බව දක්වා ඇතත් ඊට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අදාල කර ගනිමින් අධ්‍යයන දීමනාව හා පර්යේෂණ දීමනාව ඇතුලු වෙනත් ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පාලක සභා අනුමැතිය මත පමණක් ගෙවීම් කර තිබුණි. එසේම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති ජාතික විශ්වවිද්‍යාල සඳහා අනුමත තනතුරු හා වැටුප් පරිමාණයන් සාගර විශ්වවිද්‍යාලය සඳහා ද අදාළ කර ගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන තිබුණි. | පර්යේෂණ දීමනා හා අධ්‍යයන දීමනා ගෙවනු ලබන්නේ ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අදාළ සේවක සංඛ්‍යා අනුමත කිරීමේ දී ලබා දී ඇති උපදෙස් අනුව බව. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන අංශ සඳහා අනුමත තනතුරු සහ වැටුප් පරිමාණයන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බව. | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2022 පෙබරවාරි 22 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15 හා 16 | වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගත් නිළධාරියෙකුගෙන් ගිවිසුම උල්ලංඝනය කල බව දක්වමින් අය කර ගන්නා ලද වටිනාකම රු.1,732,125 ක් වූ මුදල මහාභාණ්ඩාගාරය වෙත යැවිය යුතු | නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | මෙම මුදල මහාභාණ්ඩාගාරය වෙත යැවිය යුතුය. |

| | |
|---|---|
| වගන්ති | වුවත් එය බැඳුම්කර උල්ලංඝන සංචිතයක් ලෙස හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ දක්වා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.44,713,970 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,719,057 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.36,994,913 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුහුණු වියදම්, වෙනත් වියදම්, ගිවිසුම්ගත සේවා හා සැපයුම් සේවා ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 14 හා 20 යන දෙදින තුල යෝග්‍යතා පරීක්ෂණ විභාග අධීක්ෂණ කටයුතු සඳහා සුපරීක්ෂක නිරීක්ෂක හා විභාග ශාලා සහායක තනතුරු 187 කට විධිමත් අනුමැතියකින් තොරව එකතුව රු.489,500 ක් ගෙවා තිබුණි. | 2023 වර්ෂයේදී යෝග්‍යතා පරීක්ෂණවලට අදාල විභාග රාජකාරී වෙනුවෙන් ලබාදෙනු ලබන දීමනා පිළිබඳව පොදු ක්‍රමවේදක් සකස් කර අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතිය මත ගෙවීම් කටයුතු සිදුකල යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති වෙනුවෙන් ලැබී තිබූ ප්‍රාග්ධන අරමුදල් වාර්ෂිකව නිසි පරිදි උපයෝජනය නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.9,096,181ක ශේෂයක් ඉතිරිව පැවතුණි. | රු.9,096,181ක් සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා වෙන්කරන ලද උපචිත වියදම් හා ගෙවීම් සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන වියදම් නිරවුල් කර තිබෙන අතර ඉදිරියේ දී අනෙකුත් ගෙවීම් කිරීමත් සමඟ ශේෂය සම්පූර්ණයෙන්ම නිරවුල් කෙරෙනු ඇති බව. | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන්ට අදාලව උපචිත කර ඇති රු.6,942,331 ක වියදම ඉවත් කල පසුවද මෙම බැංකු ගිණුමෙහි රු.2,153,850 ක ශේෂයක් ඉතිරිව පවතින අතර ප්‍රාග්ධන අරමුදල් නිසි කළමනාකරණයකින් යුතුව යෙදවීමත් ඉතිරි මුදල් භාණ්ඩාගාරයට වාර්තා කිරීමත් සිදු කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ කාර්ය මණ්ඩලයට පටහැනිව තනතුරු 11ක් සඳහා නිලධාරීන් 25 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී පමණක් වැටුප් හා දීමනා වෙනුවෙන් රු.31,816,612 ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සඳහා පමණක් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ හා විද්‍යාලවල උපදේශකවරු 42 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම නිසා පවත්වනු ලබන පාඨමාලා ගුණාත්මකව හා ඵලදායීව පවත්වාගෙන යාමට නොහැකි වීම හා සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවය වැඩි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | විද්‍යාලයේ කාර්යසාධනය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු වූ තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත වියදම් හා තත්‍ය වියදම් සැසඳීමේදී කර තිබූ පුනරාවර්තන වැය විෂයයන් 10ක් වෙනුවෙන් අයවැයගත වටිනාකම ඉක්මවා සියයට 40 සිට සියයට 605 අතර වියදම් දරා තිබුණි. | මෙම තත්ත්වය ආර්ථික අර්බුද කාල සීමාව තුල උද්ධමනය ඉහල මට්ටමක පැවතීම හේතුවෙන් අයවැයගත වටිනාකමට වඩා වියදම් දැරීමට සිදුව ඇති බව. | වියදම් පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදා ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |